# අන්තර්පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය

## උපදෙස් පත්‍රිකාව

## ගායන කුසලතා තරගය

1. මෙම තරගය අංශ හතර සඳහා ම පැවැත්වේ. තමන් කැමති වෘත්තයකට අනුව ගායනය ඉදිරිපත් කළ හැකි ය.

1.1. අභිමතාර්ථ

1.1.1. සාම්ප්‍රදායානුකූලව වෘත්ත හඳුනාගෙන හුදිජන ප්‍රසාදය සඳහා තම කුසලතාව ඔප් නැංවීමට පෙළඹවීම.

1.1.2. ස්මරණ ශක්තියෙන් ශ්‍රවණ මාධුර්යය රැකෙන පරිදි මධුර ස්වරයෙන් ඉදිරිපත් කිරීම, විවිධ වෘත්ත හඳුනාගැනීමට යොමු කිරීම.

1.2. තරග කොන්දේසි

1. සිංහල කවියක්, පාලි ගාථාවක් හා සංස්කෘත ශ්ලෝකයක් ඉදිරිපත් කිරීමට තරඟකරුවන්ට සිදුවේ.
2. තමන් පුරුදු පුහුණු වී පැමිණි සිංහල කවියක්, පාලි ගාථාවක් හා සංස්කෘත ශ්ලෝකයක් ඉදිරිපත් කළ යුතු ය.
3. ඉදිරිපත් කිරීම කටපාඩමින් පමණක් කළ යුතු ය.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.
5. ජාතික මට්ටම දක්වා ම සිංහල කවියක්, පාලි ගාථාවක් හා සංස්කෘත ශ්ලෝකයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

1.3. ලකුණු ලබාදීමේ ක්‍රමවේදය

| | | |
|---|---|---|
| 1. | සම්ප්‍රදායානුකූල බව | 10 |
| 2. | නිවැරැදි උච්චාරණය | 10 |
| 3. | ශ්‍රවණ මාධුර්යය | 10 |
| 4. | හැඟීම් දැනවීම | 10 |
| 5. | ස්මරණ ශක්තිය | 10 |
| | මුළු ලකුණු | 50 |